මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

නිවේදන අංක - 62
2020-04-18 ප.ව 6.10 ට

# ජන ජීවිතය යථාවත් කිරීමට ඇඳිරි නීතිය ලිහිල් කෙරේ ....

කොරෝනා වෛරසය ව්‍යාප්තිය පාලනය කිරීම පිණිස පනවනු ලැබූ ඇඳිරි නීතිය ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණ ඇතිව ලිහිල් කිරිමට රජය තීරණය කරයි.

අප්‍රේල් 20, සඳුදා සිට ඒ ඒ දිස්ත්‍රික්කවල සහ දිස්ත්‍රික්ක ඇතුළත පොලිස් බල ප්‍රදේශවල ඇඳිරි නීතිය පැනවීම සහ ඉවත් කිරීම සිදු වනුයේ මෙසේය.

1. කොළඹ, ගම්පහ, කළුතර, පුත්තලම,මහනුවර, කෑගල්ල සහ අම්පාර දිස්ත්‍රික්ක හැර සෙසු දිස්ත්‍රික්කවල දැන් ක්‍රියාත්මක ඇඳිරි නීතිය අප්‍රේල් 20 සඳුදා උදේ 5.00ට ඉවත් කොට එදිනම රාත්‍රී 8.00 ට යළි පනවනු ලැබේ. ඉන්පසු නැවත දැනුම් දෙන තුරු මේ දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය සෑම දිනකම ක්‍රියාත්මක වනුයේ රාත්‍රී 8.00 සිට පසුදා අළුයම 5.00 දක්වා පමණි.
2. මහනුවර, කෑගල්ල සහ අම්පාර දිස්ත්‍රික්කවල අලවතුගොඩ, අකුරණ, වරකාපොළ සහ අක්කරෙයිපත්තු පොලිස් බල ප්‍රදේශ තුළ ඇඳිරි නීතිය ඉවත් නොකොට දිගටම ක්‍රියාත්මක කෙරේ. මේ දිස්ත්‍රික්ක 03ට අයත් සෙසු පොලිස් බල ප්‍රදේශවල ඇඳිරි නීතිය අප්‍රේල් 20 සඳුදා සිට සෑම දිනකම උදේ 5.00ට ඉවත් කොට රාත්‍රී 8.00 ට යළි පනවනු ලැබේ.
3. කොළඹ, ගම්පහ, කළුතර සහ පුත්තලම දිස්ත්‍රික්කවල පහත සඳහන් පොලිස් බල ප්‍රදේශ හැර සෙසු පොලිස් බල ප්‍රදේශවල ඇඳිරි නීතිය අප්‍රේල් 22, බදාදා සිට උදේ 5.00 ට ඉවත්කොට රාත්‍රී 8.00ට යළි ක්‍රියාත්මක කෙරේ.

   මේ දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය **ඉවත් නොකොට දිගටම ක්‍රියාත්මක පොලිස් බල ප්‍රදේශ වනුයේ,**

   - **කොළඹ දිස්ත්‍රික්කයට අයත්** : කොටහේන, ග්‍රෑන්ඩ්පාස්, බම්බලපිටිය, කෙසෙල්වත්ත, මරදාන, ගොතටුව, මුල්ලේරියාව, වැල්ලම්පිටිය, ගල්කිස්ස, දෙහිවල සහ කොහුවල
   - ගම්පහ දිස්ත්‍රික්කයට අයත් : ජාඇල, කොච්චිකඩේ සහ සීදූව,
   - පුත්තලම දිස්ත්‍රික්කයට අයත් : පුත්තලම, මාරවිල සහ වෙන්නප්පුව සහ
   - කළුතර දිස්ත්‍රික්කයට අයත් :බණ්ඩාරගම, පයාගල, බේරුවල සහ අළුත්ගම,

4. මේ අනුව කොටහේන, ග්‍රෑන්ඩ්පාස්, බම්බලපිටිය, කෙසෙල්වත්ත, මරදාන, ගොතටුව, මුල්ලේරියාව, වැල්ලම්පිටිය, ගල්කිස්ස, දෙහිවල, කොහුවල, ජාඇල, කොච්චිකඩේ, සීදූව, පුත්තලම, මාරවිල, වෙන්නප්පුව, බණ්ඩාරගම, පයාගල, බේරුවල, අළුත්ගම, වරකාපොළ, අකුරණ, අලවතුගොඩ සහ අක්කරෙයිපත්තු යන පොලිස් බල ප්‍රදේශවල ඇඳිරි නීතිය ඉවත් කිරීමෙන් තොරව දිගටම ක්‍රියාත්මකව පවතී.

ඇඳිරි නීතිය ලිහිල් කර ඇති යම් ප්‍රදේශයක් හෝ ගම්මානයක් හෝ අවදානම් කලාපයක් ලෙස හඳුනා ගතහොත් එකී ප්‍රදේශවලට සීමාවන පරිදි ඇඳිරි නීතිය පැනවීමට ඉඩ ඇත. කිසියම් ප්‍රදේශයක් හුදකලා ප්‍රදේශයක් ලෙස නම් කර ඇත්නම් කවරකුට හෝ ඊට ඇතුළුවීම සහ ඉන් පිටවයාම සම්පූර්ණයෙන් තහනම් වේ.

ඇඳිරි නීතිය දිගටම ක්‍රියාත්මක පොලිස් බල ප්‍රදේශවල අත්‍යාවශ්‍ය සේවා සඳහා ප්‍රධාන මාර්ග ඔස්සේ ගමනාගමනයට ඉඩ ලැබේ. ඇඳිරි නීතිය ඉවත් කළ ප්‍රදේශවල ද ප්‍රධාන මාර්ග භාවිත කළ යුත්තේ රැකියා සඳහා යාම් ඊම් ඇතුළු අත්‍යාවශ්‍ය කාර්යයන් උදෙසා පමණි. දිස්ත්‍රික්ක අතර ගමනාගමනය රැකියා අවශ්‍යතා ඇතුළු අත්‍යාවශ්‍ය සේවා සඳහා පමණක් සීමා කර ඇත.

පාසල්, විශ්වවිද්‍යාල, උපකාරක පංති සහ සෙසු අධ්‍යාපන ආයතන සහ සිනමා හල් නැවත දැනුම් දෙන තුරු වසා තැබිය යුතුය.

ඇඳිරි නීතිය ලිහිල් කළ පසු දෙපාර්තමේන්තු සංස්ථා, බැංකු ඇතුළු රාජ්‍ය ආයතන සාමාන්‍ය පරිදි ක්‍රියාත්මකව තැබේ.

කොළඹ දිස්ත්‍රික්කය ඇතුළත රාජ්‍ය ආයතනවල සේවක පිරිසෙන් 1/3 ක් සේවයට වාර්තා කළ යුතුය. සෙසු දිස්ත්‍රික්කවල පිහිටි රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලයෙන් සේවයට වාර්තා කළයුතු පිරිස 50% කි. සියලු රාජ්‍ය ආයතනවල සේවයට වාර්තා නොකරන කාර්ය මණ්ඩල සාමාජිකයන් නිවසේ සිට සිය රාජකාරි ඉටු කළ යුතු බව නියම කර ඇත.  එක් එක් ආයතනයේ සේවයට වාර්තා කළ යුතු සේවක සංඛ්‍යාව සහ පැමිණිය යුතු සේවකයන් කවුරුන්ද යන්න  ආයතන ප්‍රධානියාගේ අභිමතය අනුව තීරණය කිරීමට පිළිවන. යම් දවසක කාර්ය මණ්ඩලයෙන් සේවයට කැඳවන 1/3 ට සහ 50% ට අයත් පිරිස වෙනුවට ඊළග දවසේ වෙනත් පිරිසක් තෝරා ගැනීමට ආයතන ප්‍රධානීන්ට නිදහස තිබේ.

කාර්යාල විවෘත කොට පවත්වාගෙන යාමේදී කොරෝනා වෛරසය පාලනය පිණිස සෞඛ්‍ය බලධාරීන් නියම කර ඇති  පිළිවෙත් මුලුමනින්ම අනුගමනය කළ යුතුය. සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම ආයතන ප්‍රධානියාගේ වගකීමකි.

පෞද්ගලික අංශයේ ආයතන උදේ 10.00ට විවෘත කරන ලෙස නියම කෙරේ. පෞද්ගලික ආයතනවල සේවයට වාර්තා කළ යුතු සංඛ්‍යාව සහ පැමිණිය යුතු සේවකයන් කවුරුන්ද යන්න ආයතන ප්‍රධානීන් තීරණය කළ යුතුය. මේ ආයතන ද සෞඛ්‍ය බලධාරීන් නියම කර ඇති කොරෝනා පාලන පිළිවෙත් අකුරටම පිළිපැදිය යුතු වන්නේය.

යළි විවෘත කෙරෙන කාර්යාලවල සේවකයන්ගේ ගමන් පහසුව සැලසීමට ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය සේවාව විධිවිධාන සැලසිය යුතුය. රජයේ සෙසු ආයතනවල සේවයට වාර්තා කරන සංඛ්‍යාව සීමා කළද රාජ්‍ය ප්‍රවාහන සේවාවන්හි සහ අත්‍යාවශ්‍ය සේවාවන්හි සමස්ත කාර්ය මණ්ඩලයම සේවයට වාර්තා කිරීම අනිවාර්ය වේ.

බස් රථ, වෑන් රථ හෝ දුම්රිය මැදිරිවල ගමන් කළ යුත්තේ ඒවායේ මුළු ධාරිතාවෙන් අඩක් පමණ වන මගීන් සංඛ්‍යාවකි. සියලු වාහන ද විෂ බීජ හරණයට ලක් කළ යුතුය. මේ කොන්දේසිවලට යටත්ව සිය සේවා යළි ආරම්භ කරන්නැයි රජය පෞද්ගලික ප්‍රවාහන ආයතනවලින් ඉල්ලා සිටී.

සියලු ආකාර උත්සව, වන්දනා සහ විනෝද චාරිකා, සැණකෙළි, පෙරහැර, රැස්වීම් ආදිය නැවත දැනුම් දෙන තුරු තහනම් කර ඇත. ජනයා ඒකරාශීවීම වෛරස ව්‍යාප්තිය පාලනයට බාධාවක් බැවින් ආගමික උත්සව ද අත්හිටුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කොරෝනා වෛරස ව්‍යාප්තිය හමුවේ ඇඳිරි නීතිය පැනවීම ඇතුළු ක්‍රියාමාර්ග ගනු ලැබුයේ ජනතාව මේ මරණීය වසංගතයෙන් මුදා ගැනීමේ ඒකායන අරමුණ ඇතිවය. අනුගමනය කළ දැඩි ක්‍රියාමාර්ග නිසා අත්කර ගත් ප්‍රගතිය ඇඳිරි නීතිය ලිහිල් කිරීමට ඉවහල් විය. ආර්ථිකය යළි පණ ගැන්වීම සහ අර්බුදයෙන් වඩාත් පීඩාවට පත් වූ  දිළිඳු සහ අවදානමට ලක්ව ඇති ජන කොටස්වල ජීවිතය සුරක්ෂිත කිරීම තවත් අරමුණකි.

එසේ වුවද කොරෝනා වසංගත අවදානම තවම මුළුමනින් පහව ගොස් නැත. එබැවින් වෛරස ව්‍යාප්තියට යළි ඉඩ නොලැබෙන පරිදි සියලු සෞඛ්‍ය නියමයන් පිළිපදිමින් වගකීමෙන් සහ ඉවසීමෙන් ක්‍රියා කරන්නැයි රජය ජනතාවගෙන් ඉල්ලා සිටී. ඇඳිරි නීතිය ලිහිල් කළ ද රැකියා සඳහා යාම් ඊම් හැරුණු විට අන් සෑමවිටම නිවෙස්වල රැඳී සිටින ලෙස ද අවධාරණය කෙරේ.

ඇඳිරි නීතිය ලිහිල් කළ විගස අනවශ්‍ය කලබලයකින් විශාල පිරිසක් ඒකරාශීවන අයුරින් වෙළෙඳ සැල් වෙත රැස් නොවන ලෙස ජනතාවගෙන් ඉල්ලීමක් කෙරේ.

කොරෝනා උවදුර මුලුමනින් පරාජය කළ බව  සෞඛ්‍ය බලධාරීන් නිගමනය කරන තෙක් තමාගේත්, දූ දරුවන්ගේත්, ජාතියේත් ආරක්ෂාව හා අභිවෘද්ධිය පතා සියලු අපහසුතා වගකීමෙන් ඉවසා සිටින්නැයි රජය ජනතාවට අවධාරණය කරයි.

**මොහාන් සමරනායක**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජනාධිපති මාධ්‍ය අංශය**
**2020-04-18**

මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

**Curfew regulations relaxed to restore normalcy in civilian life**

With the objective of restoring normalcy in the civilian life the Government has decided to relax the curfew imposed in order to control the spread of COVID – 19.

Lifting and imposing curfew at the district level and the Police Division level within the district will be done as follows:

1. The curfew currently in force in all other districts except the districts of Colombo, Gampaha, Kalutara, Puttalam, Kandy, Kegalle and Ampara will be lifted at 5.00am on Monday, the 20th April and will be re-imposed at 8.00pm on the same day. Thereafter the curfew in these districts will be effective only between 8.00 pm to 5.00am every day until further notice.

2. Curfew will continue in the Police Divisions of Warakapola, Alawathugoda, Akurana and Akkaraipattu in the districts of Kandy, Kegalle and Ampara.

   Curfew in other Police Divisions in these 03 districts will be relaxed daily at 5.00am from Monday, the 20th April and will be re-imposed at 8.00pm.

3. In all the Police Divisions, except the Police Divisions mentioned below, in the districts of Colombo, Gampaha, Kalutara and Puttalam curfew will be lifted at 5.00am on Wednesday, the 22nd April and will be re-imposed at 8.00pm daily.

   The Police Divisions where the curfew will continuously remain in force are:
   - Colombo district - Kotahena, Grandpass, Bambalapitiya, Keselwatta, Maradana, Gothatuwa, Mulleriyawa, Wellampitiya Mount Lavinia, Dehiwala and Kohuwala
   - Gampaha district - Ja Ela, Kochchikade and Seeduwa
   - Kalutara district - Bandaragama, Payagala, Beruwala and Aluthgama
   - Puttalam district - Puttalam, Marawila and Wennappuwa

4. Accordingly, the curfew will continue to remain in force in the Police Divisions of Kotahena, Grandpass, Bambalapitiya, Keselwatta, Maradana, Gothatuwa, Mulleriyawa, Wellampitiya, Mount Lavinia, Dehiwala, Kohuwala Ja Ela, Kochchikade, Seeduwa, Puttalam, Marawila, Wennappuwa, Bandaragama, Payagala, Beruwala, Aluthgama, Warakapola, Akurana, Alawathugoda and Akkaraipattu.

If any area where the curfew has been relaxed happens to be identified as a risk village or a zone, curfew will be re-imposed limiting only to such area. No one will be permitted to enter or leave areas designated as isolated.

In those Police Divisions where the curfew is in force main roads can be used only for the purpose of providing essential services. Even in the Police Divisions where the curfew is lifted utilization of main roads will be limited only for essential purposes including traveling to work. Movements between districts will not be allowed except for essential services including office work.

Schools, universities, tuition classes and other education institutes and cinemas will remain closed until further notice.

Once the curfew is relaxed, state entities including Departments, Corporations and banks should operate as usual.

Only 1/3rd of the total workforce of the state organizations located within the Colombo district should report to work. 50% of the staff of the state organizations in other districts should report to work. All the employees of the state sector who are not required to report for work in office should work from their homes. The responsibility to decide who should come to office and who should work from home lies with head of the each organization.

Measures recommended by the health authorities to control the spread of the virus should strictly be adhered to during office hours. The head of the organization is responsible for the provisions of facilities required to follow the recommended health guidelines.

The private sector entities should open for work at 10.00am daily. Head of the each organization has the freedom to decide who should report to work and their number.  These organizations too, should strictly follow the Coronavirus prevention measures endorsed by health authorities.

The Transport Board and the Railway Department must ensure transport facilities for the employees who report for work. Although, the number of staff attached to state institutes has been numerically limited, it is mandatory for the state transport and other essential services to function in full strength.

Busses, vans and rail carriages should transport only the half of the passengers of the full capacity. It is required to disinfect all the vehicles. The Government requests the private passenger transport organizations to resume their services obliging these conditions.

All forms of functions, pilgrimages and pleasure tours, carnivals, processions and meetings are banned until further notice. Since the congregation of people is a hindrance to the preventive measures to control the spread of the virus, the Government also requests to suspend all religious festivals.

The prime objective of all these measures including imposing curfew is to protect the people from this pandemic. The progress made with the strict measures so far adopted was instrumental in easing the curfew. Reviving the economy and providing relief to  low-income and the most vulnerable segment of the society who are hardly hit by the crisis is another purpose.

However, the risk has not yet subsided completely. Hence, the Government requests the public to follow all the health guidelines and act in a responsible manner with patience to close all avenues leading to the spread of the disease. The Government emphasizes the necessity of remaining in homes without traveling outside except for work.

The public are requested not to gather in large numbers at market places for panic buying once the curfew is lifted.

The Government reiterates to endure all these hardships for the well-being and progress of oneself, our children and the entire nation until the health authorities declare the complete victory over COVID – 19 pandemic.

Mohan Samaranayake

Director General (Media)

18.04.2020